**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මූළ ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,854,148,050 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,724,020,277 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු. 81,384,648 ක් හා රු.48,743,125 ක් හෙවත් ශුද්ධ ප්රතිපාදනයෙන් සියයට 4 ක් හා සියයට 5ක් වී පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 135 | 2,004,298,050 | 1,922,913,402 | 81,384,648 | 4 |
| 293 | 849,850,000 | 801,106,875 | 48,743,125 | 6 |
| **එකතුව** | **2,854,148,050** | **2,724,020,277** | **130,127,773** | **5** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේදී විවිධ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.70,790,059 ක ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර ඉන් රු.57,622,966 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් රු.13,167,093 ක් හෙවත් සියයට 19 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 20-02-01-04 දරන ප්‍රාදේශීය වතු සමාගම්වලින් ලැබෙන කල් බදු කුලී ආදායම ලෙස රු.950,028,664 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.694,530,337 ක් හෙවත් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 73 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව රු.255,498,327 ක් හෙවත් සියයට 27 කින් ඇස්තමේන්තුගත ආදායමට ළඟා වී නොතිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 13501 | 6,000,000 | 4,227,579 | 2,800,000 | 5,183,253 | 30,000,000 | 15,647,422 |
| 29301 | 18,000,000 | 11,487,763 | 10,200,000 | 10,699,071 | 54,000,000 | 32,117,272 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. 37,390,727 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 7002/0000/000/0331/0013 | 6,132,650 |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 7002/0000/000/0300/0013 | 31,258,077 |
| **එකතුව** | | **37,390,727** |

### 2.4.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 59,939,516 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 6000/0000/000/0015/0047 | 4,322,832 |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0148 | 55,616,684 |
| එකතුව | | 59,939,516 |

## 2 කොටස

----------

එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1. ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 24 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 05 කට සහ ඉකුත් වර්ෂයකදී නිකුත් කළ විගණන විමසුමකට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ඇ) අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 11 කට අවස්ථා 36 කදී එකතුව රු.197,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී මාස 02 ක ප්‍රමාදයකින් පසුව ඉහත (i) හි සඳහන් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වී තිබුණත්, එම

රෙගුලාසිවලට පටහැනිව එක් අවස්ථාවකදී නිලධාරියෙකු වෙත රු.25,000 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් නිකුත් කර තිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවීම සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 08 දිනැති අංක 04/2013 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව පහත පරිදි කටයුතු කර නොතිබුණි.

- ඉහත චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තම කාර්යාලයේ හා උපකාර්යාලවල ගිණුම් පියවීම පිණිස වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකු පත්කර නොතිබුණි.
- ඉහත චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය පිළිබඳ සටහන් බැංකුවට භාරදී බැංකුව වෙතින් හර නිවේදනයක් ලබාගෙන එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නොපමාව ඉදිරිපත් කළ යුතු වුවද, 2014 ජනවාරි 23 දින වන විටත් එය ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) ආදායම් ගිණුම**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ගිණුමට අනුව එකතුව රු.362,266,312 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරාසයකට අදාල විය. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා රු.950,028,664 ක් ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, ඉන් රු.694,530,337 ක ආදායම් රැස්කර තිබුණි. එම රැස්කළ ආදායමෙන් රු.500,569,015 ක් 2013 වර්ෂයට අදාල ආදායම වී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 53 ක් පමණක් වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 175(I)(ආ) ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිශෝධිත ආදායම් ඇස්තමේන්තුව වූ රු.756,066,945ක කල්බදු කුළී ආදායමෙන් සියයට 34 ක් හෙවත් රු.255,497,930 ක් අයකර ගැනිමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අගලවත්ත වතු සමාගමෙන් අයකර ගැනීමට අපේක්ෂිතව තිබුණු රු.42,444,852 ක් වූ ඇස්තමේන්තුගත ආදායමෙන් එක් වාරිකයක් හෝ අයකරගෙන නොතිබුණු අතර ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 න්

11 ක බදුකුලී ආදායම් අයකරගැනීමේ හිඟ ප්‍රතිශතය සියයට 25 සිට සියයට 77 ක් දක්වා පරාසයක පැවතුණි.

(iv) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.300,689,704 ක්වූ හිඟ ආදායමෙන් රු.193,961,322 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණු අතර තවත් සියයට 35 ක් හෙවත් රු.106,728,382 ක් හිඟහිටව පැවතුණි. එසේ බදුකුලී පමාවීම් සඳහා දණ්ඩන අයකර ගැනීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

(v) ප්‍රාදේශීය වැව්ලි සමාගම්වලට අයත් වතු උප බදුදීමක් සිදුවී තිබුණු බැවින් එම ගැටළු නිරාකරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීමට අංක 09/2564/306/145 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍යාංශයට නියෝග කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටද ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 13501 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු15,647,422 ක්වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ii) අමාත්‍යාංශයෙන් බැහැරට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 09 දෙනෙකුට අදාළව රු.99,212 ක් වර්ෂ 19 සිට වර්ෂ 29 ක් දක්වා වූ කාල පරාසයක සිට අය නොවී හිඟහිටිව පැවැතුණි.

(iii) වැඩ තහනම් කර ඇති හෝ සේවය අවසන් කර ඇති සේවකයින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.413,221 ක් වර්ෂ 4 ක සිට වර්ෂ 16 ක් දක්වා වූ කාල පරාසය සිට අයනොවී හිඟහිටිව පැවතුණි.

(iv) සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.297,274 ක ණය ශේෂ වර්ෂ 2 ක් හා වර්ෂ 4 ක් හිඟහිටිව පැවතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මෝටර් වාහන 03 ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2012 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබුණි.

## 1.5 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂයේදී සිදු වී තිබූ රු.791,265 ක් වූ අලාභ හානි විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී රු.232,500 ක ගබඩා භාණ්ඩ නැතිවීම නිසා සිදුවූ අලාභය, හානි පිළිබඳ ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 1.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 14 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 88 | 60 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 43 | 39 | 04 |
| | **එකතුව** | **152** | **115** | **37** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 37 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2. ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.2,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ත් සියයට 40 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව එකතුව රු.1,450,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය රු.1,018,331 ක් හෙවත් මාරු කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් වී තිබුණි.

**(ආ) අග්‍රිම ගිණුම**

මුදල් රෙගුලාසි 371 ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් තිදෙනෙකුට අවස්ථා 08 කදී එකතුව රු.76,340 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 29301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,604,014 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුවෙන් බැහැරට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 13 දෙනෙකුට අදාලව එකතුව රු.245,382 ක් වූ ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැති හිඟහිටව පැවතුණි.

(iii) වැඩ තහනම් කළ, සේවයෙන් පහකළ හා සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට රු.173,408 ක් හා තවත් නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 1 ක් හා වර්ෂ 4 ක කාලයක සිට අයවිය යුතු එකතුව රු.143,714 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පවතින රු.894,950 ක් හා තවත් නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂයකට වැඩි කාලයක සිට පවතින රු.105,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.29,260 ක් හා සේවය හැරගිය නිලධාරියකුගෙන් රු.6,740 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 ඔක්තෝබර් 31 දින පිළියෙල කර තිබුණි.

### 2.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය විසින් 2013 වර්ෂය සඳහා කාර්යයන් 20 ක් සම්බන්ධව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට සැලැසුම් කර තිබූ අතර එයින් කාර්යයන් 15 ක අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර වාර්තා නිකුත් කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුවට අයත් ත්‍රීරෝද රථයක් වර්ෂ 01 මාස 03 කට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවැතුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු බැරකම් රු.75,086,407 ක් වී තිබුණි.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | එකතුව |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | - | 3,600 | 3,600 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 722,155 | 711,044 | 1,433,199 |
| (iii) | හඳුනා නොගත් හර | - | 3,349 | 3,349 |

**2.7 කළමනාකරණ දුර්වලතා**

1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුව සෑම මාසයකට අදාළ දායක මුදල ඊළඟ මාසයේ අවසාන දිනට ප්‍රථම නොගෙවන්නේ නම් අධිභාර මුදලක් ගෙවිය යුතු විය. රබර් පර්යේෂණ මණ්ඩලයෙන් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණු සේවකයින් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට විධිමත් පරිදි දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.89,241 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

**2.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 18 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 03 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 352 | 249 | 103 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 72 | 72 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) * | 18 | 18 | - |
| | **එකතුව** | **487** | **360** | **127** |

**වෙනත් දෙපාර්තමේන්තුවකින් අනුයුක්ත කරන ලද දැනට සිටින තනතුරට පෞද්ගලික වන සේ අනුයුක්ත කර සිටින නිලධාරීන්*

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 127 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් පහත විස්තර සඳහන් පාර්ශවයන්ගෙන් මානව සම්පත් ලබා ගෙන තිබුණි.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| අභ්‍යන්තර විගණක | 01 | රබර් උපදේශන සේවා දෙපාර්තමේන්තුව හා රබර් පාලන දෙපාර්තමේන්තුව | 1994 වර්ෂයේ සිට |
| විගණන ලිපිකරු | 01 | | |
| ප්‍රචාරක නිලධාරී | 01 | | |
| ලිපිකරු | 14 | | |
| මුරකරු | 01 | | |